**ශීර්ෂය - 328 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය - 328 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 16 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මූළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 364.15 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 360.57 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.58 ක් හෙවත් සියයට 0.98 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

**2016 දෙසැම්බර් 31 දිනට**

| වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 330.45 | 328.83 | 1.62 | 0.49 |
| මූලධන | 33.70 | 31.74 | 1.96 | 5.82 |
| එකතුව | **364.15** | **360.57** | **3.58** | **0.98** |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 18.00 | 11.97 | 9.00 | 10.87 | 59.00 | 39.07 |

**2.3** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002 /0000/0424/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය ශේෂ එකතුව රු. 27,500 ක් විය.

**2.4** **පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.290,953 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6000/0000/00/0011/0013/0091/000 | 246,653 |
| 6000/0000/00/0011/0018/0089/000 | 44,300 |
| **එකතුව** | **290,953** |

**2.5** **විගණන නිරීක්ෂණය**

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 3.2 විසර්ජන ගිණුම

----------------

අයවැය විචලනය

------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) එක් විෂයක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම්

------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 (2) (අ),(ආ) ප්‍රකාරව අතුරු අග්‍රිමය ලබා දුන් කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළ යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට නොපිය වූ අතුරු අග්‍රිමය රු.27,500 ක් විය.

(ආ) අග්‍රිම නිරවුල් කිරීම මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කළ යුතු වුවද අවස්ථා 06 කදී එකතුව රු.61,400 ක අත්තිකාරම් නිරවුල් කිරීම මාස 02 සිට මාස 12 දක්වා වූ කාල පමාවක් සහිතව සිදුකර තිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2016 ඔක්තෝබර් 20 දින කරන ලද භෞතික තොග පරික්ෂාවේදී එදිනට තොගය සහ තොග පොතේ ශේෂයන් අතර නොසැසඳීම් අනාවරණය විය. ඒ අනුව රු. 345,669 ක් වටිනා සඟරා හා පොත් 13,492 ක් අඩුවෙන්ද රු.89,538 ක් වටිනා පිටපත් 1,114 ක් වැඩියෙන්ද පැවතුණි.

**3.5 කාර්යසාධනය**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**I. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය**

**--------------------------------------------------------------**

**(අ) ශ්‍රම වෙළඳපොල තොරතුරු ඒකකය**

**-----------------------------------**

ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොල ජාලයේ ශ්‍රී ලාංකික කොටස්කරුවා වශයෙන් කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීමට හා ප්‍රතිපත්ති සම්පාදනයටත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොල තොරතුරු අවශ්‍ය පාර්ශව වෙත සම්පාදනය කරලීම් අරමුණින් මෙම ඒකකය පිහිටුවා තිබුණි. කෙසේ වෙතත් මෙම ඒකකය සතුව ශ්‍රම වෙළඳපොල ප්‍රවණතා විශ්ලේෂණය කළ හැකි, ඒ සඳහා මනා පුහුණුවක් ලද නිපුණ සේවා නියුක්තිකයන් නොසිටීම හේතුවෙන් ශ්‍රම වෙළඳපොල වැනි නිරන්තරයෙන් වෙනස්වීම්වලට ලක්වන වෙළඳපොලක් පිළිබඳ ජාතික ආර්ථිකගත තීරණ ගැනීමට වැදගත් වන තොරතුරු කාලීනව සැපයීමේ හැකියාවක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

**(ආ) අධ්‍යාපන අංශයේ රැකියා පැතිකඩ (Job Profile)**

**-----------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියා සඳහා නිපුණතා නොගැලපීම් පිළිබඳ අධ්‍යයනයේදී තෝරාගන්නා ලද ආයතන කිහිපයකට මෙම ඒකකය විසින් සකසා ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියකට ලද තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් වාර්තාව සැකසීම සිදු කරනු ලැබේ. අධ්‍යයනය අවසානයේ දී ඊට අදාල පොතක් මුද්‍රණය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හා තෝරාගන්නා ලද විශ්ව විද්‍යාලවලට සහ අනෙකුත් ආයතන වෙත බෙදා හැරීම පමණක් සිදුකර තිබුණි. ඒ තුලින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම අතර නොගැලපීම් හඳුනා ගැනීමටත් හා ඊට විසඳුමක් සලසාගත හැකි උපායමාර්ගයක් සකස් කිරීමටත් යම් දායකත්වයක් සැලසුනේද යන්න ගැටළු සහගත වී තිබුණි.

**(ඇ) මහජන රැකියා සේවා මධ්‍යස්ථාන (PES) වල කාර්යසාධන පරීක්ෂාව**

**----------------------------------------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වලට සෘජුවම පැමිණ හා එහි වෙබ් අඩවියට පිවිසීමෙන් රැකියා අපේක්ෂකයන්ට ලියාපදිංචි වීම සිදුකළ හැකි අතර 2015 හා 2016 වර්ෂ සඳහා ලියාපදිංචි රැකියා අපේක්ෂකයන් පිළිවෙලින් 43,390 ක් හා 51,489 ක් විය. එනමුත්, ලියාපදිංචි රැකියා සපයන්නන් සහ ඔවුන් විසින් සපයන ලද රැකියා ඇබෑර්තු ප්‍රමාණය අවම මට්ටමක පැවතීම නිසා 2015 හා 2016 වර්ෂ සඳහා රැකියාගත කිරීම් පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 11 ක් විය.

(ii) මහජන රැකියා මධ්‍යස්ථානවල ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් රැකියාගත කිරීම් සිදු නොකළ අපේක්ෂකයින් තවදුරටත් වෘත්තීය මාර්ගෝපදේශනයට හා පුහුණු ආයතන සඳහා යොමු කිරීම ද මෙම මධ්‍යස්ථාන මඟින් සිදුකරනු ලැබේ. ඒ අනුව, රැකියාගත කිරීම් නොකළ රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව 2015 හා 2016

වර්ෂවල පිළිවෙලින් 36,509 ක් සහ 42,580 ක් විය. 2016 වර්ෂයේදී මෙම රැකියාගත නොකළ අපේක්ෂකයින් සංඛ්‍යාව ලියාපදිංචි රැකියා අපේක්ෂිත සංඛ්‍යාවෙන් සියයට 83 ක් විය.

**II රැකියා අපේක්ෂකයින් රැකියාගත කිරීම**

2010 පෙබරවාරි 02 දින අංක 1640/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2010 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දිවයිනේ සමස්ත මානව සම්පතෙහි වර්ධනය උදෙසා ශක්තිමත් වෘත්තිකයින් බිහි කිරීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවා තිබුණි. රැකියා නිර්මාණය, ප්‍රවර්ධනය හා වෘත්තිය මාර්ගෝපදේශනය වැනි විවිධ ක්‍රියාකාරකම් තුළින් විරැකියාව අවම කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉලක්කයක් වූ අතර 2015, 2016 වර්ෂ වල දෙපාර්තමේන්තුව විසින් රැකියාගත කිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| රැකියාගත කිරීම් | රැකියාගත කළ පුද්ගලයින් සංඛ්‍යාව | |
|---|---|---|
| | **2016** | **2015** |
| මහජන රැකියා මධ්‍යස්ථාන (PES) මඟින් | 6,089 | 4,437 |
| ප්‍රාදේශීය මට්ටමින් රැකියාගත කිරීම | 8,085 | 4,238 |
| මුළු රැකියාගත කිරීම් සංඛ්‍යාව | 14,174 | 8,675 |
| සේවා වියුක්තියෙන් රැකියාගත කිරීමේ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 4 | 2 |

ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවා වියුක්ති ජනගහනයට සාපේක්ෂව දෙපාර්තමේන්තුව විසින් රැකියාගත කිරීමේ ප්‍රතිශතය 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් සියයට 2 ක් සහ සියයට 4 ක් විය. ඒ අනුව දෙපාර්තමේතන්තුව විසින් ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය අවම කිරීමට මෙම දෙපාර්තමේන්තුව දක්වා ඇති දායකත්වය සාධනීය මට්ටමක නොපැවතුණි.

(ආ) ශ්‍රී ලංකා සේවා වියුක්ති අනුපාතය විශ්ලේෂණය කිරීමේ ස්ත්‍රී සේවා වියුක්තිය ඉතා ඉහළ මට්ටමක පැවතිණි. ඒ පිළිබඳ දත්ත පහත පරිදි වේ. ( ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)

| වර්ෂය | සේවා වියුක්ති අනුපාතය | | |
| --- | --- | --- | --- |
| | සමස්ථ | ස්ත්‍රී | පුරුෂ |
| **2014** | 4.3 | 6.5 | 3.1 |
| **2015** | 4.6 | 7.6 | 3.0 |
| **2016** | 4.4 | 7.0 | 2.9 |

ස්ත්‍රී සේවා වියුක්තිය අවම කිරීම සඳහා ඔවුන්ට වෙන් වූ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මකවී නොතිබුණු අතර ඒ සම්බන්ධව කිසිදු උපායමාර්ගික වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. කාන්තාවන් ඉලක්ක කරගනිමින් ඔවුන්ගේ විරැකියාව අවම කිරීමේ වැඩසටහන් පැවැත්වීම ජාතික වශයෙන් වැදගත් කරුණක්ව තිබිය දී දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධව සැලකිල්ලක් දක්වා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.6 පාඩු හා හානි**

දෙපාර්තමේන්තුව සතු කැබ් රථයක් සමාලෝචිත වර්ෂයේ දී අනතුරට පත් වී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා 104 (4) ප්‍රකාරව ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. නැවත අළුත්වැඩියා කිරීම සඳහා රු. 26,300 ක මුදලක් දෙපාර්තමේන්තුව දරා තිබුණු නමුත් අදාල රක්ෂණ ආයතනය එම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි. අලාභය වූ එම වටිනාකම විසර්ජන ගිණුමේ වාර්තා කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 09 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 673 | 538 | 135 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 11 | 04 |
| | **එකතුව** | **703** | **558** | **145** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 135 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් වශයෙන් මුළු පුරප්පාඩු සංඛ්‍යාව 145 ක්ව පැවතිණි. දෙපාර්තමේන්තුවේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා සක්‍රීය දායකත්වය ලැබෙන හා උපායමාර්ග වශයෙන් වැදගත් පුරප්පාඩු පිරවීමට කළමණාකාරීත්වය අපොහොසත්ව තිබුණි.